# ජී. දිලීප් අමුදන් එදිරිව ප්‍රධාන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම්, උතුරු පළාත් සභාව

RTIC Appeal/21/2017 (2017.07.10 දින පැවැත්වූ කොමිෂන් සභා රැස්වීමේ කොටසක් වශයෙන් අභියාචනය අසන ලදී.

**සභාපති** : මහින්ද ගම්මන්පිල මහතා

**කොමිෂන් සභා සාමාජිකයෝ:** ජ්‍යෙෂ්ඨ නීතිඥ කිශාලි පින්ටෝ-ජයවර්ධන
ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්.ජී. පුංචිහේවා
විනිසුරු ඒ.ඩබ්.ඒ. සලාම්
ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්

**අභියාචක** : ජී. දිලීප් අමුදන්, 361 කස්තුරියාර් පාර, යාපනය.

**නොතීසි ලබාදෙනු ලැබුවේ** : ආර්. වර්තලිංගම් මහතා, ලේකම්/නම්කළ නිලධාරී" ප්‍රධාන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය

නම් කළ නිලධරයා කොමිෂන් සභාව වෙත දැනුම් දුන්නේ උතුරු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් නියම කරන ලද රාජකාරි සඳහා තමන් සහභාගී වීම අවශ්‍ය හෙයින් කොමිෂන් සභා විභාගය සඳහා පැමිණිය නොහැකි බවයි. ඔහු විසින් තමන් වෙනුවෙන් පෙනී සිටීම සඳහා පී. ජෙයරාජ්, තොරතුරු නිලධාරී, ප්‍රධාන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය, උතුරු පළාත් සභාව සහ, ජේ. ලෝරන්ස් මහතා, පරිපාලන නිලධාරී, ප්‍රධාන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය, උතුරු පළාත් සභාව යන නිලධාරීන් දෙදෙනාව නියෝජිතයන් වශයෙන් එවා තිබිණි.

වැල්වැටිතුරෙයි නගර සභාව විසුරුවා හැරීමට මගපැදූ පරීක්ෂණ වාර්තාව අභියාචක විසින් සිය තොරතුරු ඉල්ලීම මගින් ඉල්ලා සිටියේය. එම ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් ඔහු වෙත තනි පිටුවකින් යුත් සාරාංශ වාර්තාව ලබාදීම සිදුවිය. සිය තොරතුරු ඉල්ලීම ඉටු නොවූ බව සඳහන් කරමින් අභියාචක පසුව නම් කළ නිලධරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළේය. නම් කළ නිලධරයා ඔහුගේ අභියාචනයට ප්‍රතිචාර දැක්වූයේ සම්පූර්ණ වාර්තාව ලබාදීම නගර සභාවේ හිටපු සාමාජිකයන්ගේ සුබසිද්ධියට අහිතකර වන බැවින් සහ, ඔවුන්ගෙන් ඇතැමෙක් මේ වන විට පළාත් සභාවේ සාමාජිකයන් වන හෙයින් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5(1)(ඔ) වගන්තිය ප්‍රකාරව ඔවුන්ගේ වරප්‍රසාදවලට බලපෑමක් එයින් සිදුවන බවයි. ඉන්පසු අභියාචක විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය කර තිබේ.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත පොදු අධිකාරිය දීර්ඝ වශයෙන් කරුණු සැළ කර සිටියේ සම්පූර්ණ වාර්තාවේ වැදගත් සාක්ෂි සහ ඇසින් දුටුවන්ගේ ප්‍රකාශ ඇතුළත් වන බව සහ, එකී පරීක්ෂණය ප්‍රසිද්ධියේ පැවැත්වූවක් නොවන බවයි. එසේම ඔවුන් තවදුරටත් කියා සිටියේ පාර්ලිමේන්තු සහ පළාත් සභා සාමාජිකයන්ට අදාළ වන වරප්‍රසාද නාගරික සභා සාමාජිකයන් දක්වා ද දීර්ඝ කළ හැකි බවයි.

කොමිෂන් සභාව සිය මතය ගෙන හැර දක්වමින් කියා සිටියේ පනතේ 5(1)(ඔ) වගන්තිය සෑම අවස්ථාවකදීම තොරතුරු ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීම සඳහා පොදු වශයෙන් යොදාගත නොහැකි බව සහ, ඕනෑම අවස්ථාවදී මෙම අතුරු විධානය යොදාගත හැක්කේ ව්‍යවස්ථාපිතව නම් කර ඇති දැඩි සීමාකිරීම්වලට යටත්ව බව ය. තවද මේ අනුව අනුමිත හෝ ව්‍යංග දීර්ඝ කිරීමක් සිදුකළ නොහැකි බව ය. ඉන්පසුව තුන්වන පාර්ශවයන් සම්බන්ධ වීමේ ගැටලුව සැලකිල්ලට ලක් කෙරිණි. කොපමණ තුන්වැනි පාර්ශවයන් සංඛ්‍යාවක් මෙම ගැටලුවට සම්බන්ධදැයි කොමිෂන් සභාවට දැනගැනීමට අවශ්‍ය

වූ අතර, ඇසින් දුටුවන් වශයෙන් තුන්වැනි පාර්ශවයන් 10 ක් පමණ මෙම වාර්තාවට සම්බන්ධ බව කොමිෂන් සභාවට දැනුම් දෙන ලදී.

මෙවිට කොමිෂන් සභාව පොදු අධිකාරිය වෙත දැනුම් දී සිටියේ මෙවන් අවස්ථාවලදී අදාළ තුන්වැනි පාර්ශවයන් සම්බන්ධ කරගෙන, එම තොරතුරු මුදාහැරීම සඳහා ඔවුන්ගේ විරෝධතාවක් තිබේදැයි සොයාබැලීමට පනතේ 29 වන වගන්තිය ප්‍රකාරව තොරතුරු නිලධරයාට වගකීම තිබෙන බවයි. මෙවිට පවා 29(2) අතුරු විධානය ප්‍රකාරව, තුන්වැනි පාර්ශවයන්ගේ විරෝධතාවය තිබියදී පවා මහජන සුබසිද්ධිය සඳහා එම තොරතුරු සැපයීම පිළිබඳ සලකා බැලීමට කොමිෂන් සභාවට හැකි බවයි.

අභියාචක සඳහන් කළේ එම වාර්තාව දූෂණ අක්‍රමිකතා සම්බන්ධයෙන් වන හෙයින් ඉහළ මහජන සුබසිද්ධියක් මෙහිදී පවතින බවයි. මෙම ගැටලුවේදී වැඩි බරක් පවතින්නේ මහජන සුබසිද්ධිය වෙත බව කොමිෂන් සභාව සඳහන් කළේය. 29(2)(අ) වගන්තිය අනුව තොරතුරු නිලධරයාගේ ඉල්ලීමට තුන්වන පාර්ශවයන් ප්‍රතිචාර නොදැක්වුවහොත් පොදු අධිකාරිය එම තොරතුරු මුදා හැරිය යුතු බව ද කොමිෂන් සභාව පොදු අධිකාරියට සිහිපත් කර දුන්නේය.

## <u>කොමිෂන් සභාවේ නියෝගය</u>

මෙම අභියාචනය, වැල්වැටිතුරෙයි නගර සභාවේ ගැටලු සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීමට පත් කළ ඒක පුද්ගල කොමිෂන් සභාවේ කාර්යපටිපාටින් සහ නියෝග උතුළත් සම්පූර්ණ තොරතුරු හෙළිදරව් කිරීම නම් කළ නිලධරයා විසින් ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙනි. තුන්වන පාර්ශවයන්ගේ සම්බන්ධතාවය සැලකිල්ලට ගනිමින් ලඝු තොරතුරු සැපයීම මගින්, තොරතුරු නිලධරයා එකී තොරතුරු ඉල්ලීමට ප්‍රතිචාර දක්වා තිබේ. මෙයින් පෙනී යන්නේ එම තොරතුරුවලට සම්බන්ධ පුද්ගලයන්ගේ පුද්ගලිකත්වය ට එරෙහිව තමන්ව ආරක්ෂා කර ගනිමින් දීර්ඝ විස්තරයක් හෙළි නොකිරීමට තොරතුරු නිලධරයා ප්‍රවේශම් වූ බවයි. මෙම සාරාංශය සම්බන්ධයෙන් තෘප්තිමත් නොවූ අභියාචක, නම් කළ නිලධරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළේය. නම් කළ නිලධරයා මෙම අභියාචනය ප්‍රතික්ෂේප කළේ 2016 අංක 12 දරණ තොරතුරු දැනැගනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5(1)(ඔ) වගන්තිය ප්‍රකාරව පළාත් සභා සාමාජිකයන්ගේ සහ නගර සභා සාමාජිකයන්ගේ වරප්‍රසාද උපුටා දක්වමිනි. ඉන්පසු අභියාචක සිය තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් පරම අවසරය ඉල්ලා සිටිමින් තොරතුරු කොමිෂන් සභාව වෙත අභියාචනය කළේය. කොමිෂන් සභාව මේ පිළිබඳ දරණ මතය වන්නේ පනතේ 5(1)(ඔ) වගන්තිය කිසිදු නගර සභා වරප්‍රසාදයකට අදාළ නොවන අතර, එය නීතියෙන් විධිවිධාන සලසන පරිදි පාර්ලිමේන්තු සහ පළාත් සභාවට අදාළ වරප්‍රසාදවලට පමණක් සීමා වන බවය.

තවදුරටත් කොමිෂන් සභාව සඳහන් කළේ ගැටලුවට සම්බන්ධ තුන්වන පාර්ශවයන්ගේ සමස්තය නිලධාරීන් සහ සාක්ෂිකරුවන් දස දෙනෙක් පමණ වන හෙයින්, තීරණයක් ගැනීමට පෙර ඔවුන්ගෙන් මේ පිළිබඳ විමසීම අත්‍යාවශ්‍ය බවයි. තුන්වන පාර්ශවයන් තොරතුරු හෙළිදරව් කිරීමට සිය කැමැත්ත පළ කළේ නම් සිය තීරණය ගැනීමට පෙර මේ පිළිබඳ සලකා බැලීමට තොරතුරු නිලධරයාට නිදහස ඇත. කොමිෂන් සභාව විසින් දෙපාර්ශවයටම සිහිපත් කර දුන්නේ පනතේ 29 වන වගන්තිය, තොරතුරු ලබාදීම හෝ ප්‍රතික්ෂේප කිරීමට පූර්වයෙන් බලාත්මක වන සුවිශේෂී විධිවිධානයක් බවයි. මේ අනුව තොරතුරු නිලධරයාගේ සහ නම් කළ නිලධරයාගේ තීරණය පසෙක තැබූ කොමිෂන් සභාව, මෙම ගැටලුව නැවත තොරතුරු නිලධරයා වෙත යොමු කළේ, එය අදාළ තුන් වන පාර්ශවයන්ගේ සහභාගිත්වය මත නැවත සලකා බලා නීතියට අනුව තීරණයක් ලබාදෙන ලෙස ය.